**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය - 2018**

**------------------------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා රාජ්‍ය** අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ට පටහැනිව පාරිතෝෂික වියදම වූ රු.1,854,749 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ලෙස ගැලපීම හා ගෙවිය යුතු පාරිතෝෂික රු.777,426 ක් කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට ගැළපීම වෙනුවට රු.1,077,323 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගලපා තිබුණි. | පාරිතෝෂික වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීමට සහ ගෙවිය යුතු පාරිතෝෂික කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට ගැලපීමට මෙම වර්ෂයේදී කටයුතු කරනු ඇත. | ප්‍රමිතියේ නියමයන්ට අනුව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව මෝටර් රථවල ඵලදායී ජීව කාලය නිසි ඇගයීමකින් තොරව වර්ෂ 4 කට සීමා වන පරිදි ක්ෂය කර තිබුණි. පිරිවැය රු.6,390,000 ක මෝටර් රථයක් ඵලදායී ජීවිත කාලය ඇගයීමෙන් තොරව හා ඉහත ක්ෂය ප්‍රතිපත්තියට පටහැනිව වර්ෂයකට සියයට 6.2 බැගින් ක්ෂය කර තිබුණි. එසේම ප්‍රමිතියේ 65 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ පිරිවැය රු.31,565,440 ක් වූ මෝටර් රථ 5 ක් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි. | මෝටර් රථ ක්ෂය කිරීමේ අනුපාතය සරල මාර්ග ක්‍රමය අනුව සියයට 25 ක් වූ අතර ඵලදායී ජීව කාලය වර්ෂ 04 ක් වන පරිදි ක්ෂය කිරීම් සිදු කර ඇත. ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව 2018 වර්ෂයේ අවසන් ගිණුම් සකසන විට ඵලදායී ජීවකාලය ගණනයේ බලපෑම (Impact) ගැලපුම් කර අවසන් ගිණුම් වල දක්වා ඇත. මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු වාහන 4 ක ඵලදායී ජීවිත කාලය 2018 වර්ෂයෙහි නැවත ආගනනය කර රු.6,897,500 ක් ලෙස මෝටර් රථ ගිණුමෙහි සටහන් කර ගිණුම් සටහන් වලද සඳහන් කර ඇත. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කල යුතුයි. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මෝටර් රථවලට අදාල ක්ෂය ප්‍රතිපාදනය රු.126,875 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මිලදී ගත් දිනට අදාළව ක්ෂය වටිනාකම නිවැරදි වේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව නිවැරදි ක්ෂය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

-------------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය | පරිවාස කාලයේ සිටින නිලධාරීන් අධ්‍යයන හා අභ්‍යාස සඳහා පිටරට නොයැවිය යුතු වුවත් පරිවාස කාලයේ සිටි නිලධාරීනියක විදේශ පුහුණුවකට යවා තිබුණි. | නිලධාරීනියට පුද්ගලික විදේශ නිවාඩු අනුමත කිරීමේදී ආයතන සංග්‍රහයේ 23.4.1 වගන්තියේ සඳහන් පරිදි ඉතා හදිසි පුද්ගලික හේතුවක් වශයෙන් සලකා කටයුතු කොට ඇත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | 2015, 2016 සහ 2017 වර්ෂවල විගණන වාර්තා ඇතුළත් වාර්ෂික වාර්තා විගණන දිනය වූ 2019 මාර්තු 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2015, 2016 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා භාර දී ඇති අතර, 2017 වාර්ෂික වාර්තාව ඉදිරියේදී සභාගත කිරීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,787,629 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,311,124 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,098,753 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෞද්ගලික පඩිනඩි වියදම රු.8,448,921 කින් හා ප්‍රාග්ධන ආයෝජන වියදම් රු.5,154,920 කින් වැඩි වුවද පුහුණු පාඨමාලා ආදායම රු.2,516,645 කින් හා පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රදාන රු.17,414,000 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ නිලධාරියෙකු විසින් 2007 වර්ෂයේ සිදුකරන ලද රු.2,395,749 ක රන් රිදී වංචාවක් සම්බන්ධයෙන් තවදුරටත් අයවිය යුතු රු. 750,869 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් අයකර ගැනීමට නඩු පැවරිය නොහැකි බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති බැවින් රු.750,869 පොත් වලින් ලියා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, අමාත්‍යාංශ ලේකම් හරහා මහා භාණ්ඩාගාරය වෙත දන්වා යවා ඇත. | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩිපුර ගෙවූ වැටුප් හා දීමනා ලෙස රු.619,646 ක් අයකර ගත යුතු නිලධාරියෙකු වෙනත් ආයතනයකට මුදාහැර තිබූ අතර එම මුදල් විගණිත දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර වැටුප් ගෙවීම් රු.619,646 ක් අයකර ගැනීම සඳහා ඔහුට එදිරිව එන්තරවාසියක් යවා ඇත. ඒ අනුව අදාළ නිලධාරියාට එරෙහිව නඩු පැවරීමට නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. | අදාල මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයතනයේ නිලධාරීන් තිදෙනෙකු 2017 නොවැම්බර් 04 සිට 10 දක්වා මියන්මාරයේ සිදුකල රාජකාරි සංචාරයක් සඳහා රු.801,826 ක වියදමක් දරා තිබුණි. ආයතනයේ මධ්‍යස්ථානයක් මියන්මාරයේ පිහිටුවීම, එරටෙහි මුතු බෙල්ලන් වගා කිරීමේ දැනුම මෙරටට ගෙන ඒම තුලින් විදේශ විනිමය ඉපයීම සංචාරයේ ප්‍රධාන අරමුණු විය. ආයතනයේ කාර්යභාරයට අයත් නොවූ මුතු බෙල්ලන් වගාවට අදාල දැනුම මෙරටට ගෙන ඒම සඳහා විදෙස් සංචාරය අනුමත කර තිබීම හා දින 3 ක් පැවති වැඩසටහන සඳහා දින 7 කට සංචාරයක් අනුමත කර දින 6 කට සංයුක්ත දීමනා ගෙවීම නිසා රු.103,092 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | ආයතනය මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාලව පර්යේෂණ හා පුහුණු කටයුතු සිදුකරනු ලබන බැවින් කර්මාන්තය ආශ්‍රිත ක්ෂේත්‍රයක් වන මුතු බෙල්ලන් වගාව පිළිබඳ දැනුම පර්යේෂකයන් හට තිබීම පර්යේෂණ කටයුතු සඳහා වැදගත් වේ. සංචාරය පැවති දින 05 පුරාවට ක්ෂේත්‍රයට අදාල දැනුම ලබාගත හැකි විය. සංචාරයට අදාල සැලසුම් සකස් කිරීමේදී භාෂාව පිළිබඳ ගැටළු හේතුවෙන් ප්‍රමාණවත් තොරතුරු සඳහන් වී නැති බව පිළිගනිමි.<br>මුදල් චක්‍රලේඛ 01/2015/01 හි 4(ඇ) වගන්තියේ දක්වා ඇති පරිදි සම්පූර්ණ දින 06 ක් සඳහා සංයුක්ත දීමනා ගෙවීම් කර ඇත. | ආයතනික අරමුණු ඉටුකර ගැනීමට අදාලව කටයුතු කල යුතු අතර වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලසුම් අනුව එකතුව රු.මිලියන 2.35 ක් වැයකර ඉටුකිරීමට නියමිතව තිබූ පර්යේෂණ අංශයේ ක්‍රියාකාරකම් 3 ක් සහ පරිපාලන හා මානව සම්පත් අංශයේ ක්‍රියාකාරකම් 2 ක් වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. පරිපාලන හා මානව සම්පත් අංශයේ ක්‍රියාකාරකම් 2 ක් සඳහා වෙන්කර තිබූ රු.මිලියන 30.95 කින් රු.මිලියන 20.1 ක් පමණක් වැයකර තිබුණි. | ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ප්‍රතිපාදන වෙනත් ව්‍යාපෘතියක් සඳහා යොමු කිරීම, මුදල් ගෙවීමට අදාල ඉන්වොයිසිපත් හා මූලාශ්‍ර ලේඛන ආයතනය වෙත ඉදිරිපත් නොවීම හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව රු.මිලියන 8 ක ප්‍රතිපාදන එම වසරේදී නිකුත් නොකිරීම යන හේතු නිසා කාර්යසාධනය අත්පත්කරගත නොහැකි විය.<br><br>සමස්ථයක් ලෙස 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය සියයට 77 ක් හා භෞතික ප්‍රගතිය සියයට 98 ක් පමණ ප්‍රතිශතයක් අත් පත් කර ගෙන තිබුණි. | ක්‍රියාකාරී සැලස්ම ප්‍රායෝගික විය යුතු අතර එහි ඉලක්ක ළඟාකර ගැනීමට ආයතනය කටයුතු කල යුතුයි. |

(ආ) ශ්‍රී ලංකාව තුල මැණික් නිධි ගවේෂණය හා ඇගයීමේ ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| (i) කාර්ය මණ්ඩලයට කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 23 දෙනෙකු බඳවාගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය ලබාදී තිබුණද එම බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | අනුමත තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති මාසික දීමනා ප්‍රමාණවත් නොවූ නිසා බඳවා ගැනීමට කටයුතු නොකර ආයතනයේ සිටින ස්ථිර කාර්ය මණ්ඩලය හරහා ව්‍යාපෘති කටයුතු සිදු කරගෙන ඇත. විශ්ව විද්‍යාලවලින් කෙරෙන ඉල්ලීම් මත යොදවන පුහුණුලාභීන්ගේ සහාය ආයතනයේ පර්යේෂණ කටයුතු සඳහා ලබා ගන්නා ලදී. | ව්‍යාපෘතිය සඳහා අනුමත කාර්ය මණ්ඩලය යෙදවිය යුතුයි. |
| (ii) ව්‍යාපෘතිය පළමු අදියර යටතේ 2017 – 2021 කාලය තුල දිස්ත්‍රික්ක 5 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 50 ක් තුල මැණික් නිධි ගවේෂණය කර සිතියම් සකස් කිරීම සහ අවසාන වාර්තා නිකුත් කිරීම කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික්ක 2 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 9 ක පමණක් මැණික් නිධි ගවේෂණ කටයුතු සිදු කරමින් පැවතුණි. එයින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5 ක් සඳහා පමණක් මැණික් විභව සිතියම් ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 2 ක් සඳහා පමණක් අවසාන වාර්තා ද නිකුත් කර තිබුණි. | තණමල්විල හා කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ගවේෂණ කටයුතු සිදු කල පර්යේෂණ නිලධාරීන් ආයතනයෙන් ඉවත් වීම මත මැණික් විභව සිතියම් සහ අවසාන වාර්තා නිකුත් කිරීමේ නොහැකි වූ අතර, ආයතනයේ දැනට සිටින පර්යේෂණ නිලධාරීන් යොදවා එම කාර්ය අවසන් කෙරේ. බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැණික් නිධි ගවේෂණ කාර්යය අවසන් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. | අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (iii) අවසාන වාර්තා නිකුත් කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 2 හි මැණික් නිධි ඇතැයි අනාවරණය වූ ඉඩම් 78 ක් පෞද්ගලික හිමිකරුවන් වෙතද, ඉඩම් 44 ක් රජයේ හිමිකාරිත්වය යටතේද පැවතුණි. හඳුනාගත් රජයේ ඉඩම් වෙන්දේසි කිරීම හා සිතියම් අලෙවිය තුලින් ආදායම් උපයාගැනීමේ ක්‍රියාමාර්ග කෙරෙහි යොමු වී නොතිබුණු අතර පෞද්ගලික ඉඩම්වල සිතියම් විකිණීමට අවශ්‍ය වැඩපිළිවෙලක්ද සකස් කර නොතිබුණි. | ව්‍යාපෘතිය හරහා හඳුනාගත් මැණික් ඉඩම් වෙන්දේසි සඳහා යොමු කිරීමේ කටයුතු ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ එක්ව ආරම්භ කර සාර්ථක ප්‍රගතියක් ළඟා කරගෙන ඇත. ජයභූමි, ස්වර්ණභූමි බලපත්‍ර සහිත ඉඩම්ද සුදුසු පරිදි කැණීම්, වෙන්දේසි සඳහා යොමු කිරීමට කටයුතු සිදුකෙරේ.<br><br>ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත යොමු කරන ලද සුදුසු ස්ථාන 5 ක නියමු ව්‍යාපෘතියට අදාලව හල්දුම්මුල්ල ප්‍රදේශයේ පතල් කැණීම් නුදුරේදීම සිදු කිරීමට නියමිතය. | ව්‍යාපෘති ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අගය අඩු මැණික්වල වර්ණය හා පැහැදිලිබව වැඩි කිරීමට සහ වඩා ඵලදායී හා කාර්යක්ෂම ක්‍රම හඳුන්වාදීමේ රු.9,975,088 ක් වූ වර්ෂ 3 ක ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. ගිවිසුම අනුව ව්‍යාපෘතිය ආරම්භ කර වසර දෙකක් තුල ඉටුකල යුතු Oiling සහ wax coating treatments සහ මිලදී ගත යුතු වූ යන්ත්‍ර 2 ක් විගණිත දින දක්වා මිලදී ගෙන නොතිබුණි. ව්‍යාපෘතියට 2017 වර්ෂයේ ලබාදී තිබූ රු.4,115,848 කින් රු.2,639,564 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වැයකර නොතිබුණි. | ව්‍යාපෘතිය ආරම්භයෙන් දෙවසරක් ඉකුත් වීමට ප්‍රථම, පිරියම්කරණ කටයුතු සිදුකර ඇත. Pressure vessel උපකරණය මිලට ගැනීමට ප්‍රතිපාදන ජාතික විද්‍යා පදනමින් නිදහස් කර නොමැති බැවින් මීළඟ වර්ෂය සඳහා ලබාදෙන මූල්‍යාධාරවලින් මිලදී ගැනීමට නියමිතය. 2019 අප්‍රේල් මස 30 දින වන විට රු.3,927,534 ක මුදලක් වැය කර ඇත. | නියමිත කාර්යසාධනය ළඟාකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ඈ) | ආයතනය වර්ෂය තුල පාඨමාලා සඳහා බඳවාගත් සිසුන් 1,220 කින් 284 ක් එනම්, සියයට 23 ක් පාඨමාලා හැර ගොස් තිබුණි. පොළොන්නරුව පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා 2 ක් පමණක් පවත්වා තිබූ අතර ඒ සඳහා බඳවාගත් සිසුන් 21 න් 09 ක් පාඨමාලාව හැරගොස් තිබුණි. ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති වීමෙන් මධ්‍යස්ථානය වසා දමා තිබුණි. සිසුන් 40 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබූ පාඨමාලාවක් පවත්වා නොතිබුණි. | පෙර වර්ෂ වලට සාපේක්ෂව විගණන වර්ෂයේ පාඨමාලා හැරගොස් ඇති සිසුන්ගේ ප්‍රමාණය අවම මට්ටමක පවතින අතර පාඨමාලා සම්පූර්ණ කරන ලද සිසුන්ගේ ප්‍රතිශතය ආසන්න වශයෙන් සියයට 80 කි. මැණික් කර්මාන්තය ව්‍යාප්ත ව පැවති ඇළහැර සහ බකමූණ ප්‍රදේශවල විවිධ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කළ ද පුහුණුලාභීන් හඳුනා ගැනීම ගැටළු සහගත විය. 2015 සිට 2018 දක්වා සිසුන් 132 ක් සඳහා පුහුණුව ලබා දී ඇති අතර එම පිරිස ප්‍රදේශයේ කර්මාන්තය ව්‍යාප්තිය සඳහා ප්‍රමාණවත් වනු ඇත.<br><br>මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ පාඨමාලා සැලසුම් කළ ද ඉල්ලුම් කිරීම හා සිසුන් සහභාගී වීම ප්‍රමාණවත් නොවීම නිසා පාඨමාලා ආරම්භ නොකෙරුණද ඉදිරියේ දී පාඨමාලා තවදුරටත් සංවර්ධනය කර ආරම්භ කිරීමට කටයුතු කර ඇත. | පාඨමාලාවල සිසුන් රඳවා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහන 2 ක් වර්ෂ 9 ක හා වර්ෂ 2 ක කාලයක සිට නිශ්ක්‍රීයව තිබුණි. | කැබ් රථය විකිණීම සඳහා කටයුතු කල ද ඇස්තමේන්තු මුදලට ගැණුම් කරුවන් ඉදිරිපත් නොවීම නිසා විකිණීමට නොහැකි විය. ත්‍රීරෝද රථය සමඟ අපහරණය කිරීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී. | වත්කම් භාවිතයට ගැනීමට හෝ අපහරණයට කටයුතු කල යුතුයි. |

**3.5** **ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු.13,000,000 ක ප්‍රතිපාදන වෙන්කර මිලදී ගැනීමට සැලසුම් කල උපකරණ මිලදී ගෙන නොතිබූ අතර ඉකුත් වර්ෂයේ සැලසුම් කල උපකරණ මිලදී ගැනීමට රු.8,730,976 ක් වැයකර තිබුණි. | 2017 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කළ ද වර්ෂයේ මුදල් නොලැබීම මත ගෙවීමට නොහැකි වූ හා ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කල නොහැකි වූ භාණ්ඩ සඳහා 2018 වර්ෂයේ ගෙවීමට සිදුවුණි. | සැලසුම් ප්‍රකාරව මිලදී ගැනීම් සිදු කිරීමට කටයුතු කල යුතුයි. |

**3.6** **ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුහුණු අංශයට වත්කම් 3 ක් මිලදී ගැනීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීමකට අනුව ලැබී තිබූ මිල ගණන් පැහැදිලි හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කර රු.162,552 ක් වැයකර නැවත පුවත්පත් දැන්වීම් පලකර තිබුණි. | සීමිත තරඟකාරී ලංසු කැඳවීම් ක්‍රමයට වඩා ජාතික තරඟකාරී ලංසු කැඳවීම සුදුසු බවට කළමනාකාරීත්වය ගත් තීරණයක් මත හා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත නැවත මිල ගණන් කැඳවීම සිදුකරන ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) ආයතනය විසින් ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.2 ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කර තිබුණේ 2018 ජූනි 04 දිනදීය. | 2019 වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත. ප්‍රසම්පාදන සැලැස්ම වර්ෂය මුලදී සකස් කර 2018.02.20 දින අනුමැතියට ඉදිරිපත් කරන ලද නමුත් අනුමැතිය ලැබීමට යම් කාලයක් ගතව ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ඇ) පුහුණු අංශයට Gemmological Trinocular stereo Zoom Microscope උපකරණ මිලදී ගැනීමට රු.275,000 ක මිල තාක්ෂණ ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබියදී, ප්‍රසම්පාදන කමිටුව විසින් මිලදී ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. එම උපකරණ සඳහා දෙවන වර මිල ගණන් කැඳවීමේදී ලැබී තිබූ රු.547,560 ක මිලට ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත මිලට ගෙන තිබුණි. එහිදී අදාල උපකරණ ඒකක 2 ක් මිලදී ගැනීමේදි ආයතනයට සිදුව තිබූ අලාභය රු.545,120 ක් විය. 2018 සැප්තැම්බර් ආරම්භ කරන පාඨමාලාවකට අවශ්‍ය මෙම උපකරණය 2019 මාර්තු වන විටද ආයතනයට ලැබී නොතිබුණි. | තාක්ෂණික පිරිවිතර නිසි පරිදි හඳුනා නොගැනීම නිසා නැවත තාක්ෂණික පිරිවිතර සකස් කර දෙවන වර මිල ගණන් කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව මිල ගණන් කැඳවීමේදී අවම මිල ලැබී තිබූ, තාක්ෂණික පිරිවිතර නිසි පරිදි සපුරා තිබූ ආයතනයෙන් මිල දී ගැනිම නිර්දේශ කරන ලද අතර උපකරණ දෙක මේ වන විට සපයා ඇත. | තාක්ෂණ පිරිවිතර නිසි පරිදි හඳුනාගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකල යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේ අනුමත කාර්ය මණ්ඩලය 131 ක් වූ අතර ඉන් 58 ක් පුරප්පාඩුව පැවතුණි. වර්ෂ 8 ක් පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර සඳහා බඳවා ගැනීමට විගණිත දින දක්වා කටයුතු කර නොතිබුණි. | සමස්ත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය හිමි නොවිණි. මේ වන විට ස්ථිර සේවක සංඛ්‍යාව 86 ක් වන අතර ඉහත පරතරය සියයට 36 ක් දක්වා අවම කර ගෙන ඇත. අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවුවද සුදුසුකම් සහිත අයදුම්පත් නොලැබීම නිසා බඳවා ගැනීමට නොහැකි විය. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට හා ඉහළ කළමණාකරණ මට්ටමේ තනතුරු පිරවීමට කටයුතු කළ යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර මානව සම්පත් හා පරිපාලන, පර්යේෂණ සහ පුහුණු අංශ සඳහා පමණක් ආංශික සැලසුම් පිළියෙල කර තිබුණි.<br>මූල්‍ය හා භෞතික ඉලක්ක දක්වමින් ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූල වන ආකාරයට කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි. | ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂික ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදන වලට අනුකූලව සකස් කරනු ලබයි. එක් එක් අංශ මඟින් ක්‍රියාකාරී සැලසුම් පිළිබඳ වගකීම් දරන බැවින් ආයතනයේ ප්‍රධානතම අංශ වූ පර්යේෂණ හා පුහුණු අංශ සඳහා සහ සහයෝගී අංශ වශයෙන් සැලකෙන පරිපාලන හා මානව සම්පත් අංශයට අදාල ආංශික ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඇත. සියළුම ක්‍රියාකාරකම් වලට අදාල භෞතික සහ මූල්‍ය කාර්යසාධනය කාර්යසාධන වාර්තාවල දක්වා ඇත. | නියමිත පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු අතර කාර්යසාධන වාර්තාවල නියමිත පරිදි ඉලක්ක හා කාර්යසාධනය දැක්විය යුතුය. |